# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 737 - 1992 ඔක්තෝබර් 16 වැනි සිකුරාදා - 1992.10.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස-පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... | - | තනතුරු - ඇබෑර්තු ... ... | 1352 |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | - |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... | - | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 1354 |
| පළාත් සභා නිවේදන ... ... | 1336 | බඩුබාහිරාදිය විකිණීම් ... ... | - |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... | - | කොටුපල්, බේත්ද හා වෙනත් බේත්ද විකිණීම් ... | - |
| | | විවිධ දැන්වීම් ... ... | - |



සැ. යු :- (i) මාතර අහදියා සංගමය (සංස්ථාගත කිරීමේ ) පනත් කෙටුම්පත සහ අත්තිඩිය මත්තිමුල්ල ශ්‍රී ධර්මාශෝක විහාරස්ථ විද්‍යාරක්ෂක සභාව (සංස්ථාගත කිරීමේ ) පනත් කෙටුම්පත, 1992 අප්‍රේල් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

(ii) දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත් කෙටුම්පත සහ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත 1992 මැයි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රී ලංකා ප්‍රවෘත්ති කලාවේදීන්ගේ සංගමය ( සංස්ථාගත කිරීමේ ) පනත් කෙටුම්පත සහ පිළියන්දල ධර්ම ශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ ) පනත් කෙටුම්පත, 1992 මැයි මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 1992 අංක 9 දරන දණ්ඩනීතිසංග්‍රහය ප්‍රතිසංස්කරණය කිරීමේ භාර අරමුදල් පනත, 1992 අංක 10 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත සහ 1992 අංක 11 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත, 1992 මාර්තු මස 06 වෙනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12.0 අවසන් කරනු ලැබේ. තනතුරු ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව- එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර පැහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර-එනම් 1992 ඔක්තෝබර් මස 23 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 1992 ඔක්තෝබර් මස 09 වැනි දින දහවල් 12.0 හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

1992 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

"සමිතිකරුවකු" යන්නෙන් මේ සඳහා වෙනත් මධ්‍යම පළාතේ සමුපකාර සංවර්ධන ඒකක භාර අධිකාරවරයාගේ ප්‍රඥප්ති ඉටු කිරීම සඳහා පත් කරන ලද නිලධාරියා වශයෙන් අදහස් කෙරේ.

මෙම ප්‍රඥප්තිය අර්ථනිරූපණයේ විෂයයෙහි වෙනත් තත්වයක් මේ නම් ඉංග්‍රීසි අනුවාදයේ සංශෝධනය, දෙමළ හා ඉංග්‍රීසි බලපාන්නේ ය.

කොමිෂන් සභාවේ සාමාජිකයෙකු විසින් කළ යුතු දිවුරුම් ප්‍රකාශය

......................වන මම සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත් කිරීම හේතු කොට ගෙන මධ්‍යම පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/ සාමාජික වශයෙන් එම තනතුරේ කටයුතු අපක්ෂපාතීව, බියකින්, නිසරුපක්ෂපාතීව හෝ ද්වේෂයකින් තොරව ඉටු කරන බවත්, එසේ කිරීමේ දී මට අනුව කිසිම කරුණක් ගැන කිසිම දෙයක්, රාජකාරියට විනා වෙනත් පුද්ගලයෙකුට කෙලින්ම හෝ වක්‍රව අනාවරණය නොකරන බවත්, මෙයින් ගරු ගාම්භීර පූර්වකව/ අවංකව දිවුරා ප්‍රකාශ කර සිටිමි. / ප්‍රතිඥා දෙමි.

1991 ක් වූ ............ මස ............ වැනි දින මා ඉදිරියේ දී / දිවුරා ප්‍රකාශ කරන ලදී. / ප්‍රතිඥා දෙන ලදී.

මහාධිකරණයේ විනිශ්චයකාරතුමා.

කොමිෂන් සභාවේ නිලධාරියෙකු විසින් කළ යුතු දිවුරුම් ප්‍රකාශය

...............වන මම මධ්‍යම පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/ නිලධාරියෙකු වශයෙන් රාජකාරි කටයුතු ඉටු කිරීමට නියමිතව කරන කොට ගෙන එම ලේකම්/ නිලධාරී තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී රාජකාරියට අදාළව විනා, වෙනත් කවර විටක දී හෝ මාගේ රාජකාරි කටයුතුවල දී දැන ගන්නට ලැබෙන කිසිම ලියවිල්ලක, සංදේශයක හෝ තොරතුරක අඩංගු කවර ආකාරයක හෝ කරුණක් හෝ එහි කොටසක් කිසිම පුද්ගලයෙකුට කෙලින්ම හෝ වක්‍රව අනාවරණය නොකරන බවට මෙයින් ගරු ගාම්භීරව පූර්වකව/ දිවුරා ප්‍රකාශ කර සිටිමි. / ප්‍රතිඥා දෙමි.

1991 ක් වූ ............ මස ............ වැනි දින මා ඉදිරියේ දී / දිවුරා ප්‍රකාශ කරන ලදී. / ප්‍රතිඥා දෙන ලදී.

සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති.

10 - 325/1

---

මගේ අංකය - මපස/ජී/12/90 (viii).

මධ්‍යම පළාත් සභාව

මෙහි දක්වෙන ප්‍රඥප්තිය 1991ක් වූ නොවැම්බර් මස 26 වැනි දින පැවැති මධ්‍යම පළාත් සභාවේ සභා රැස්වීමේ දී ඒකමතිකව සභා සම්මත වූ අතර, අංක ජීපීසී/ජීඑස්/3 හා 1992ක් වූ ජනවාරි මස 08 වැනි දින දරන ලිපියෙන් එයට මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

පී. ආර්. රණසිංහ,
සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව.

1992 සැප්තැම්බර් මස 17 වැනි දින,
මධ්‍යම පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 91,
පල්ලේකැලේ,
කුණ්ඩසාලේ.

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක : 09 දරන පළාත් සභා ක්‍රීඩා ප්‍රඥප්තිය

මධ්‍යම පළාතේ පළාත් ක්‍රීඩා සභාවක්, දිස්ත්‍රික් ක්‍රීඩා සමිති, ප්‍රාදේශීය ක්‍රීඩා සමිති, ඇති කිරීම සඳහා ද, ක්‍රීඩා අරමුදලක් ඇති කිරීම සඳහා ද, ක්‍රීඩා සංවිධාන ලියාපදිංචි කිරීම සහ පරිපාලනය කිරීම සඳහා ද, ක්‍රීඩා සම්බන්ධ විනිසුරුවන් පුහුණුව ඇති කිරීම සඳහා ද, ක්‍රීඩාංගණ ඇති කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

01. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1990 අංක 09 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතිය ලැබුණු දිනයේ සිට මෙය ක්‍රියාත්මක වේ.

ක්‍රීඩා සභාවක් ආදිය පිහිටුවීම

02. මේ ප්‍රඥප්තියෙන් දක්වා ඇති කාර්යයන් පිණිස මේ ප්‍රඥප්තියෙහි මතු දක්වෙන විධිවිධානවලට අනුකූලව—

(අ) පළාත් ක්‍රීඩා සභාවක්,
(ආ) දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු කීපයක්,
(ඇ) අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු ගණනක්,
(ඈ) "පළාත් ක්‍රීඩා අරමුදල" නමින් හඳුන්වනු ලබන අරමුදලක්,
(ඉ) ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානයක්,
(ඊ) අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ක්‍රීඩා-ගණ ගණනක් පිහිටුවනු ලැබිය හැකිය.

ක්‍රීඩා අධ්‍යක්ෂවරයා සහ අනෙක් නිලධරයන් පත් කිරීම

03. (1) ක්‍රීඩා අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබිය යුතුය. ක්‍රීඩා අධ්‍යක්ෂවරයා වශයෙන් මේ ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් පවරනු ලබන කාර්යයන් සහ කර්තව්‍යයන් යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතුය.

(2) එක් සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරයෙකු හෝ ඊට වැඩි ගණනක් සහ මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් පත් කරනු ලැබිය හැකිය.

(3) මේ වගන්තියේ (1) වැනි හා (2) වැනි උපවගන්ති යටතේ පත් කරනු ලබන සියලු නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුය.

(4) මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කරන යම් නිලධරයෙක් විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් නොවිය යුතුය.

(5) මේ වගන්තිය යටතේ පත් කරන ලද සියලුම නිලධරයන් විසින් සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

## I වැනි කොටස

### පළාත් ක්‍රීඩා සභාව, දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු සහ ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු පිහිටු වීම

බස්නාහිර පළාත් ක්‍රීඩා සභාව පිහිටුවීම

04. (1) බස්නාහිර පළාතේ ක්‍රීඩා නගාසිටුවීම, දියුණු කිරීම සහ දිරිගැන්වීම සඳහා සහ ශාරීරික අධ්‍යාපන හා විනෝදාංශ වර්ධනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන "බස්නාහිර පළාතේ ක්‍රීඩා සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) ඒ සභාව -

(අ) ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් ;
(ආ) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ ;
(ඇ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන) ;
(ඈ) තරුණ කටයුතු පිළිබඳ පළාත් අධ්‍යක්ෂ ;
(ඉ) පළාත් පාලන කොමසාරිස් ;
(ඊ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ; සහ
(උ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද වෙනත් සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් ද සමන්විත විය යුතුය.

(3) (අ) ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් මේ සභාවේ සභාපතිවරයා විය යුතුය.

(ආ) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරයා සභාවේ ලේකම් වශයෙන් ක්‍රියා කළ යුතුය.

(4) සභාවට පත් කරනු ලබන සාමාජිකයෙකු පළාතේ වෙනත් ක්‍රීඩා සභාවක/ ක්‍රීඩා සමාජයක/වෙනත් ක්‍රීඩා සංවිධානයක සාමාජිකත්වය දරීම අත්‍යවශ්‍ය විය යුතුය.

(5) සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් සහ සභාවේ රැස්වීම් සඳහා ගණපූර්ණය නියෝග මගින් නියම කරනු ලැබිය යුතුය.

(6) සභාවේ රැස්වීම්වල කාර්යය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා සභාව මගින් රීති සම්පාදනය කළ හැකිය.

සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය, සහ ධුරයෙන් ඉවත් කිරීම ආදිය.

05. (අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සභාපති හා සාමාජිකයින් ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ මියයාමෙන් ධුරය කලින් හිස් වුවහොත් මිස ඔවුන් සිව් අවුරුදු කාලයක් එම ධුරය දැරිය යුතුය.

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යතාවයක් බව අමාත්‍යවරයා සලකනහොත් හේතු නොදක්වා ඔහු විසින් එසේ කළ හැකි අතර, එම ඉවත් කිරීම යම් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

(ඇ) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන්, හෝ ඉවත් කරනු ලැබීමෙන් ධූරය හිස් වන සභාපති හෝ යම් සාමාජිකයෙකු වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙකු, එසේ හිස් වූ ධූරය දැරූ තැනැත්තාගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් එම ධූරය දැරිය යුතුය.

සභාවේ සේවය කිරීමට නුසුදුසුකම්.

06. යම් තැනැත්තෙකු—

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තෙකු ලෙස විනිශ්චය කරනු ලැබුව හොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තෙකු වශයෙන් විනිශ්චය කරනු ලැබුව හොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් තැනීමෙහි, කොටස් එක්කර සෑදීමේ, විකිණීමේ හෝ නිෂ්පාදනය කිරීමෙහිලා කෙළින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවයක් දරන්නේ නම් ; හෝ

(ඈ) චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයක දී වරදකරුවෙකු කරනු ලැබුවහොත් ;

ඒ තැනැත්තා සභාවේ සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

නැවත පත්කරනු ලැබීමට සාමාජිකයෙකු සුදුසු බව.

07. කාලය ඉකුත්වීමෙන් ධූරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය.

වැඩ බලන සාමාජිකයන් පත් කිරීම.

08. අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයෙකු අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා ඔහුගේ ධූරයෙහි යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත්, සාමාජිකයෙකු ලෙස ඔහු වෙනුවෙන් වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් අන්කිසි තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය.

දිස්ත්‍රික් ක්‍රීඩා

09. (1) දිස්ත්‍රික්ක තුළ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය, විනෝදාත්මක කටයුතු දියුණු කිරීම, සංවර්ධනය සහ දිරිගැන්වීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට සහ පළාත් ක්‍රීඩා සභාවට උපදෙස් හා සහාය ලබාදීම සඳහා යෝග්‍ය යැයි සිතන ආකාරයේ දැනුම්දීමක් මගින් අමාත්‍යවරයාට මධ්‍යම පළාතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක් බැගින් පිහිටුවිය හැකිය.

(2) (අ) පරිපාලන දිස්ත්‍රික්කයන් සඳහා පිහිටුවනු ලබන සෑම දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක්ම අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකුගෙන් ලේකම්වරයෙකුගෙන් සහ දහහත් (17) දෙනෙකුට වැඩි නොවන තවත් සාමාජික සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

(ආ) දිසාපතිවරයා හෝ අමාත්‍යවරයා විසින් නම් කරන තැනැත්තෙකු එහි සභාපතිවරයා විය යුතුය.

(ඇ) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරියා එහි ලේකම්වරයා විය යුතුය.

(ඈ) එහි අනෙක් සාමාජිකයන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ශාරීරික අධ්‍යාපන) කරුණු කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සහ පළාත් බද ක්‍රීඩා මණ්ඩල සහ ප්‍රාදේශීය ක්‍රීඩා කමිටුවලින් විය යුතුය.

දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල ක්‍රියාකාරීත්වය.

10. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල ක්‍රියාකාරීත්වය සහ යුතුකම් සහ ඒ කමිටුවල රැස්වීම්වලට ගණපූරණය නියෝග මගින් නියම කරනු ලැබිය යුතුය.

දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල රීති.

11. සෑම දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක් විසින්ම ඒ කමිටුවේ රැස්වීම්වලට කාර්යය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා රීති සම්පාදනය කළ යුතුය.

සාමාජිකයන්ගේ ධූරය දැරීම.

12. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක සාමාජිකයන් මිය යාමෙන් හා ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය හිස්වුවහොත් මිස, සිව් අවුරුදු කාලයක් එම ධූරය දැරිය හැකිය.

(2) දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවකට අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ යම් සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කිරීම, අවශ්‍යතාවයයි නව අමාත්‍යවරයා සලකන්නේ නම් හේතු නොදක්වා ඔහුට එසේ කළ හැකි අතර, එසේ ඉවත් කිරීම යම් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

(3) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන්, හෝ ඉවත් කරනු ලැබීමෙන් ධූරය හිස් වන සාමාජිකයෙකු වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙකු, එසේ හිස් වූ ධූරය දැරූ සාමාජිකයාගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

සාමාජිකයන් නැවත පත් කිරීම.

13. කාලය ඉකුත්වීමෙන් ධූරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය.

වැඩ බලන සාමාජිකයින්

14. අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා තම ධූරයේ කාර්යයන් ඉටු කිරීමට යම් සාමාජිකයෙකු තාවකාලිකව අපොහොසත් වුවහොත්, ඔහු වෙනුවෙන් සාමාජිකයෙකු ලෙස වැඩ බැලීමට අන්කිසි තැනැත්තෙකු අමාත්‍යවරයාට පත් කරනු ලැබිය හැකිය.

දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක සාමාජිකයින් වශයෙන් සේවය කිරීම සඳහා නුසුදුසුකම්.

15. යම් තැනැත්තකු —

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත්, හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ, කිසියම් තැනැත්තකු හෝ සමාගමක් සැපයීම, විකිණීම හෝ නිෂ්පාදනය කිරීමෙහිලා කෙලින්ම හෝ වක්‍ර ලෙසින් සම්බන්ධතාවයක් දරනහොත් ; හෝ

(ඈ) වංචා දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයක දී වරදකරු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා යම් දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවකට සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු.

16. (1) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ක්‍රීඩා ශාරීරික අධ්‍යාපනය සහ විනෝදාත්මක ක්‍රීඩාවන් දියුණු කිරීම, සංවර්ධනය සහ දිරිගැන්වීම කිරීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට/දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවට උපදෙස් හා සහාය ලබාදීම සඳහා යෝග්‍යය සිතන ආකාරයේ දැන්වීමක් ප්‍රසිද්ධ කිරීම මගින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු සංඛ්‍යාවක් පිහිටුවිය හැකිය.

(2) ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු -

(අ) ප්‍රාදේශීය ලේකම් ;

(ආ) ක්‍රීඩා නිලධාරී ;

(ඇ) කලාපීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු ;

(ඈ) මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීවරයෙකු ;

(ඉ) තරුණ සේවා නිලධාරියෙකු ; සහ

(ඊ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය.

(3) ප්‍රාදේශීය ලේකම් ප්‍රාදේශීය ක්‍රීඩා කමිටුවේ සභාපති විය යුතුය.

(4) ක්‍රීඩා නිලධාරියා ප්‍රාදේශීය ක්‍රීඩා කමිටුවේ ලේකම් විය යුතුය.

17. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව ප්‍රාදේශීය ක්‍රීඩා කමිටුවල කාර්යයන් සහ යුතුකම් සහ ඒ කමිටුවල රැස්වීම්වල ගණපූරණය නියෝග මගින් නියම කරනු ලැබිය යුතුය.

ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු රීති සෑදීම.

18. සෑම ප්‍රාදේශීය ක්‍රීඩා කමිටුවක්ම විසින්ම ඒ ක්‍රීඩා කමිටුවේ රැස්වීම්වල කාර්යය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා රීති සම්පාදනය කළ යුතුය.

සාමාජිකයින්ගේ ධුර කාලය.

19. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් ප්‍රාදේශීය ක්‍රීඩා කමිටුවක සාමාජිකයන් මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය කලින් හිස් වුවහොත් මිස සිව් අවුරුදු කාලය සීමාවක් ධුරය දැරිය යුතුය.

සාමාජිකයන් ධුරයෙන් ඉවත් කිරීම.

20. (1) ප්‍රාදේශීය ක්‍රීඩා කමිටුවකට අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යතාවෙන් බව අමාත්‍යවරයා සලකනහොත් හේතු නොදක්වා නියමට එසේ කළ හැකි අතර, එම ඉවත් කිරීම යම් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

(2) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන්, හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස් වන යම් සාමාජිකයෙකු වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙකු, එසේ හිස් වූ ධුරය දැරූ සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතුය.

21. කාලය ඉකුත්වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය.

22. අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා ධුරයේ කාර්යයන් ඉටු කිරීමට යම් සාමාජිකයෙකු තාවකාලිකව අපොහොසත් වුවහොත්, ඔහු වෙනුවෙන් සාමාජිකයෙකු ලෙස වැඩ බැලීමට අන්කිසි තැනැත්තෙකු අමාත්‍යවරයාට පත් කරනු ලැබිය හැකිය.

ප්‍රාදේශීය ක්‍රීඩා කමිටුවක සාමාජිකයින් වශයෙන් සේවය කිරීම සඳහා නුසුදුසුකම්

23. යම් තැනැත්තකු—

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ, කිසිවක් ඇතිවෙනි කොටස් එක්කර පැදීමෙහි විකිණීමෙහි හෝ නිෂ්පාදනය කිරීමෙහිලා කෙලින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවයක් දරනහොත් ; හෝ

(ඈ) වංචනික දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයක දී වරදකරු කරනු ලැබුවහොත්

ඒ තැනැත්තා ඒ කමිටුවේ සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

24. පළාත් ක්‍රීඩා සභාවේ ද, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ක්‍රීඩා කමිටුවල ද වැඩ හා විනය කටයුතු පාලනය සඳහා ඇමතිතුමාට රෙගුලාසි පැනවිය හැකි අතර, ඒවා පළාත් සභාවට ඉදිරිපත් කර සභා සම්මත කර ගත යුතුය. විනය පාලනය.

25. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, මහ නගර සභා මන්ත්‍රීවරුන්, නගර සභා සහ ප්‍රාදේශීය සභා සභිකයින් වැනි ක්‍රියාකාරී දේශපාලනඥයින්, පළාත් ක්‍රීඩා සභාවේ, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ක්‍රීඩා කමිටුවල සාමාජිකත්වය දැරීම සඳහා තෝරා නොගත යුතුය. කමිටුවලට සාමාජිකයින් තෝරා ගැනීම.

## II වැනි කොටස

### *පළාත් ක්‍රීඩා අරමුදලක් පිහිටු වීම සහ පරිපාලනය කිරීම*

26. මධ්‍යම පළාතේ ක්‍රීඩා කටයුතු දිරි ගැන්වීම සහ ඒවා සංවර්ධනය කිරීම සඳහා මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ හා මධ්‍යම පළාත් ක්‍රීඩා අරමුදල යනුවෙන් හැඳින්වෙන්නා වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය. පළාත් ක්‍රීඩා අරමුදල පිහිටුවීම.

27.(1) (අ) මධ්‍යම රජය විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියළුම ප්‍රදාන මුදල් ; අරමුදලට කළ යුතු ගෙවීම්.

(ආ) අරමුදලේ කාර්යයන් සඳහා කලින් කල මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල් ;

(ඇ) විදේශීය රටවල්වලින් ආධාර වශයෙන් ලැබෙන සියළුම මුදල් ;

(ඈ) යම් තැනැත්තෙකු විසින් අරමුදලට කරන ලද පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළු මුදල් ; සහ

(ඉ) වෙනත් යම් මාර්ගවලින් ලැබෙන මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

(2) එසේ වුවද, යම් නිශ්චිත කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත යුතුය යන කොන්දේසිය මත මේ වගන්තියේ (ඇ) (ඈ) සහ (ඉ) ඡේද යටතේ මුදලක් ලැබුණු අවස්ථාවක ඒ මුදල් අරමුදලේ බැරට භාර ගැනීම සම්පූර්ණයෙන්ම අමාත්‍යවරයාගේ අභිමතය අනුව විය යුතුය.

(3) එසේම කවුරුන් හෝ ප්‍රදාන හෝ පරිත්‍යාග කිරීම පිණිස යොදා ගැනීමට හෝ යම් කිසි නිශ්චිත කාර්යයන් සඳහා භාරයක් වශයෙන් තබා ගැනීමට අමාත්‍යවරයාගේ අභිමතය අනුව මුදල් භාර ගනු ලැබිය හැකි අතර, ඒ මුදල් අරමුදලට බැර නොකර වෙනම තබා ගත හැකිය.

(4) 3 වැනි උප වගන්තිය යටතේ අරමුදලට බැර නොකර ඇමතිවරයාගේ අභිමතය පරිදි වෙනම තබා ගන්නා මුදල් පාලනය පිළිබඳව රෙගුලාසි සම්පාදනය කර, ඒවා පළාත් සභාවේදී සභා සම්මත කරවා ගත යුතුය.

28. යම් නිශ්චල හෝ චංචල දේපළ පරිත්‍යාගයක් මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා යෙදීම පිණිස අරමුදල වෙනුවෙන් අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබිය හැකිය. එවැනි යම් දේපළක් අමාත්‍යවරයාගේ අභිමතය පරිදි සහ ඔහු විසින් නිශ්චය කරනු ලබන ආකාරයට විකුණා ඒ විකිණීමෙන් ලැබෙන මුදල් අරමුදලට බැර කරනු ලැබිය හැකිය. චංචල හා නිශ්චල දේපළ පරිත්‍යාග.

29. (1) අරමුදල අමාත්‍යවරයාගේ පාලනය සහ පරිපාලනය යටතේ තිබිය යුතු අතර, අමාත්‍යවරයාගේ උපදෙස් වලට යටත්ව අමාත්‍යාංශයේ ලේකම් විසින් පරිපාලනය කළ යුතුය. අරමුදලෙහි පරිපාලනය.

(2) අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම පිණිස උපදේශක සභාවක් වශයෙන් මධ්‍යම පළාතේ ක්‍රීඩා සභාව කටයුතු කරනු ලැබිය යුතුය.

(3) එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකි තාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතුය.

(4) එක් එක් ලිත් වර්ෂයක් සම්බන්ධයෙන් සම්පූර්ණ ලෙස හා උචිත ලෙස අරමුදලේ ගණන් හිලව් පවත්වාගෙන යාමට අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු සලස්වා ගත යුතුය.

(5) 1971 අංක 38 දරන මුදල් පනතෙහි II වැනි කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අරමුදලේ මුදල් පාලනය හා ගණන් හිලව් තැබීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(6) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

අරමුදල පිළිබඳ වාර්තාව.

30. අමාත්‍යවරයා විසින් හැකිතාක් ඉක්මණින් එක් එක් මුදල් වර්ෂය සඳහා වූ අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් එම වර්ෂයේ එම අරමුදලේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක් ද, ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමඟ මධ්‍යම පළාතේ පළාත් සභාව හමුවේ තැබිය යුතුය.

අරමුදලින් කරනු ලබන ගෙවීම්.

31. අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන් –

(අ) මධ්‍යම පළාතේ යම් ක්‍රීඩාවක් දිරිගැන්වීම එය වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ද,

(ආ) ක්‍රීඩා ක්ෂේත්‍රයෙහි දක්වා ඇති යම් දක්ෂතාවකට හා ලබාගත් ජයග්‍රහණයකට සැලකිලි දැක්වීමක් වශයෙන්ද, ක්‍රීඩාවලට දනට සහභාගි වන්නන්ට හෝ ඉහත දී සහභාගි වූවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන් ද,

(ඇ) යම් බැංකුවක ස්ථිර තැන්පතු ලෙස හෝ ආණ්ඩුවේ යම් ණය මුදලක හෝ ණයකරවල ආයෝජනය කිරීම සඳහා ; සහ

(ඈ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා ද

එම අරමුදලෙන් ගෙවනු ලැබිය හැකිය.

## III වැනි කොටස

## ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම සහ පරිපාලනය කිරීම

ක්‍රීඩාවන් හෝ ක්‍රීඩා පන්තියන් නම් කිරීම.

32. පළාත් බද යම් ක්‍රීඩා සංගමයක් පිහිටුවිය හැකි, යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැනුම් දීමක් මගින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකිය.

පළාත් ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම.

33. 32 වැනි වගන්තිය යටතේ වූ දැනුම් දීමක් මගින් යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක් නම් කරනු ලැබූ කල්හි–

එවැනි දැනුම් දීමක් කරනු ලැබූ අවස්ථාවේ ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා පන්තිය පිළිබඳව පවත්නා වූ යම් පළාත් බද සංගමයක්, මේ ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක් පිළිබඳව පළාත් බද සංගමයක් ලියාපදිංචිය සඳහා අයැදුම් කරන ආකාරයෙන්ම ඒ පළාත් බද සංගමය ද ලියාපදිංචිය සඳහා අයැදුම් කළ යුතුය.

ලියාපදිංචි කිරීමේ තීරණ සම්බන්ධව අභියාචනා

34. එවැනි ලියාපදිංචි කිරීමේ තීරණයක් හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් තෘප්තියට පත් නොවන යම් තැනැත්තෙකුට අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකිය. ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණ වන්නේය.

පළාත් ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීමේ පරිපාටිය සහ ලියාපදිංචි කරන ලද ක්‍රීඩා සංගමයක බලතල හා කාර්යයන්.

35. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය :–

(අ) ක්‍රීඩා සංවිධාන ලියාපදිංචි කිරීමේ කාර්ය පරිපාටිය සහ ඒවා ලියාපදිංචි කිරීම සඳහා අය කළ යුතු ගාස්තු,

(ආ) එවැනි සංගම්වල සහ ක්‍රීඩා සමාජවල සංයුතිය හා සංස්ථාපනය,

(ඇ) ඒ සංගම්වල සහ ක්‍රීඩා සමාජවල යුතුකම් බලතල හා කාර්යයන්,

(ඈ) ඒ සංගම්වල සහ ක්‍රීඩා සමාජවල තීරණවලට හෝ ක්‍රියාවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ කාර්යය පරිපාටිය,

(ඉ) ඒ සංගම් විසින් පුහුණකයන්, තීරකයන්, පරිපාලන්නන් සහ විනිශ්චයකරුවන් පත් කිරීමේ කාර්යය පරිපාටිය.

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම අත්හිටුවීම සහ අවලංගු කිරීම.

36. (අ) ක්‍රීඩා සංගමයේ නිලධාරීන්ගේ හෝ සාමාජිකයන්ගේ දූෂණ විෂමාචාරය හෝ අක්‍රමිකතාවයක් සඳහා ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලිඛිත නිවේදනයක් මගින් දැනුම් දෙනු ලැබූ විට ඒ නිවේදනයේ සඳහන්ව තිබිය හැකි කාලය තුළ දී එසේ ප්‍රතිකර්ම යෙදීමට අපොහොසත් වීම හෝ ප්‍රතිකර්ම යෙදීම නොසලකා හැරීම නිසා; හෝ

(ආ) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා අකර්මණ්‍යව සිටීම, සහයෝගය නොදීම, හෝ අවහිර කිරීම නිසා; හෝ

(ඇ) සංගමයේ යුතුකම් සහ කාර්යයන් ඉටු කිරීම පැහැර හැරීම නිසා ;

ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

37. අත්හිටුවනු ලැබූ හෝ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හැකහොත් අවලංගු කරනු ලැබූ ක්‍රීඩා සංගමයක කාර්යයන් කරගෙන යාම සඳහා තාවකාලිකව වැඩ පිළිවෙලක් අමාත්‍යවරයා විසින් ඇති කළ හැකිය. තාවකාලික නියෝග.

38. 33 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් නොකළ හෝ ලියාපදිංචි කිරීම 36 වැනි වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද හෝ අවලංගු කරන ලද යම් ක්‍රීඩා සංගමයක් විසුරුවා හරින ලෙස අමාත්‍යවරයා විසින් නියම කළ හැකි අතර, ඒ නියමයෙහි සඳහන් කර තිබිය යුතු කාලය තුළ දී ඒ සංගමය විසුරුවා හැරීමෙන් සහ එහි කටයුතු අවසන් කරලීමෙන් ඒ සංගමයේ නිලධරයන් විසින් ඒ නියමය ක්‍රියාවට යෙදවිය යුතුය. පළාත් ක්‍රීඩා සංගම් විසුරුවා හැරීම.

39. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව ලියාපදිංචි කර නොමැති යම් ක්‍රීඩාවකට හෝ ක්‍රීඩා පන්තියකට අදාළ සංගමයකට මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ලැබීමට හිමිකම් ඇති යම් පහසුකමක්, ගුණදායක සේවාවක් හෝ ආධාරයක් ලැබීමට හිමිකමක් නොතිබිය යුතුය.

40. යම් ක්‍රීඩා සංගමයක් සම්බන්ධයෙන් කරන ලද විසුරුවා හැරීමේ නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම අවශ්‍යාවෙර්ශිත බව අමාත්‍යවරයා සළකනහොත්, එවැනි ක්‍රීඩා සංගමයක යම් දූෂණ, විෂමාචාර හෝ අකුමිකතා තිබේනම් ඒවාට අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රදුහු යැයි සෙත්වා දෙන ප්‍රතිකර්ම යොදන ලෙස ඒ සංගමයේ සාමාජිකයින්ට නියම කළ හැකිය. ඉන්පසු තම අභිමතය අනුව අමාත්‍යවරයා විසින් ඒ ක්‍රීඩා සංගමය ලියාපදිංචි කිරීමට හෝ නැවත ලියාපදිංචි කිරීමට අවසර දිය හැකිය. විසුරුවා හැරීමේ නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ බලය

## IV වැනි කොටස

### ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය සහ ක්‍රීඩා ශිල්පායතනයන් පිහිටුවීම

41. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්යයන් සඳහා ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදාන එකක් හෝ ඊට වැඩි ගණනක් පිහිටුවනු ලැබිය හැකිය. ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය.

(අ) ක්‍රීඩා ශාරීරික අධ්‍යාපනය සහ විනෝදාත්මක කරුණු පිළිබඳ දැනුම සහ උනන්දුව ඇති කිරීම.

(ආ) ක්‍රීඩා පිළිබඳ සහජ දක්ෂතාවයක් ඇති දරුවන්ගේ අවශ්‍යතාවයන් සපයා දීමෙන් ඔවුන්ගේ දෙමව්පියන්ට ඇතිවන මානසික අසහනය සැහැල්ලු කිරීම.

(ඇ) ක්‍රීඩා කුසලතාවයන් හඳුනාගෙන ඒවා වැඩි දියුණු කර ගැනීමට අවස්ථාවන් උදාකර දීම.

(ඈ) ක්‍රීඩා කුසලතාවයන් ඇති දරුවන් පළදායී ඵලදායි ක්‍රියාවන් කෙරේ යොමු කිරීම.

(ඉ) උසස් ප්‍රතිඵල ඇති කර ගැනීමට හැකිවන අයුරු නියමිත වයස් සීමාවන් තුළ දී විද්‍යානුකූල ක්‍රීඩා පුහුණුවක් ලබාදීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම.

42. අමාත්‍යවරයා විසින් නියෝග මගින් :- නියෝග.

(අ) ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා තෝරා ගැනීමේ පරිපාටිය,

(ආ) ප්‍රදානය කරනු ලබන්නා වූ ක්‍රීඩා ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම,

(ඇ) මේ කාර්යය සඳහා අවශ්‍ය සංවිධායකයින්, දේශකයින්, පුහුණුකරුවන්, ගුරුවරුන්, උපදේශකයින් හා වෙනත් නිලධාරීන් බඳවා ගැනීමේ සහ ඔවුන්ට වේතන ගෙවීමේ පරිපාටිය සහ ඉගැන්වීමේ, පුහුණුකිරීමේ සහ විභාග පැවැත්වීමේ සහ ක්‍රීඩා ශිෂ්‍යත්වලාභීන් විසින් ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීම පිළිබඳ පරිපාටි

නියම කරනු ලැබිය හැකිය.

43. අමාත්‍යවරයාට -

(අ) ක්‍රීඩා පුහුණුව සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලද ශිල්පායතනවලට සහ පාසැල්වලට පහසුකම් සැලසීම, පුහුණුව හා නේවාසික පහසුකම් හා වෙනත් කාර්යයන් සඳහා ගොඩනැගිලි ඉදි කිරීම ඉඩකඩ සලසාදීම, ඒවා නඩත්තු කිරීම සහ උපකරණ සපයාදීම සඳහා ද, පහසුකම් සැපයීම ආදිය පිළිබඳ අමාත්‍යවරයාගේ බලතල

(ආ) ඒ පාසැල්වල හා ආයතනවල ශිෂ්‍යත්ව ලාභීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ විනය සහ ප්‍රගති සාධනය ඇති කිරීම හා විධිමත් කිරීම සඳහා ද,

(ඇ) ඒ පාසැල් හෝ අධ්‍යාපන ආයතනවලට ශිෂ්‍යත්ව ලාභීන් ඇතුළත් කිරීමේ විධිවිධාන සැලැස්වීම සඳහා ද

බලය ඇත්තේ ය.

ක්‍රීඩාංගණ සහ ක්‍රීඩා සංකීර්ණ සංස්ථාපනය.

44. ක්‍රීඩා පුහුණුවීම්, තරග පැවැත්වීම් ශාරීරික අධ්‍යාපනය හා විනෝදාත්මක කටයුතු පෙළගැස්වීම් කිරීම, උනන්දු කරවීම සහ සංවර්ධනය කිරීම සඳහා මෙහි මින්මතු "ක්‍රීඩාංගන" වශයෙන් හඳුන්වනු ලබන ක්‍රීඩා සංකීර්ණ, ක්‍රීඩා භූමි, ක්‍රීඩා පිට්ටනි හෝ ක්‍රීඩාංගණ පිහිටුවීම සඳහා, අමාත්‍යවරයා විසින් අනුග්‍රහය දක්වීම හෝ සැලැස්වීම කළ හැකිය.

අරමුදල් පැවරීම.

45. සංස්ථාපනය හා ඉදිකිරීම් සඳහා ධනය සඳහන් පරිදි මුදල් සපයනු ඇත :-

(අ) රජයෙන් සපයන මුදල් ;

(ආ) පළාත් සභාවේ අරමුදල්වලින් වෙන් කරනු ලබන මුදල් ;

(ඇ) විදේශ රටවලින් ලැබෙන ආධාර මුදල් ;

(ඈ) පරිත්‍යාග වශයෙන් ලැබෙන මුදල් ;

(ඉ) වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල් ;

ගොඩනැගිලි ආදිය සැපයීම සඳහා අමාත්‍යවරයා ගේ බලතල.

46. එවැනි යම් ක්‍රීඩාංගණයක නේවාසික හෝ වෙනත් යම් කාර්යයක් සඳහා යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට හෝ පිහිටුවීමට හෝ පැවැත්වීමට හෝ උපකරණ සැපයීමට හෝ අමාත්‍යවරයාට බලය තිබිය යුතුය.

නියෝග.

47. අමාත්‍යවරයාගේ නියෝග :-

(අ) එවැනි යම් ක්‍රීඩාංගණයක පරිපාලනය, කාර්මික සහ වෙනත් නිලධාරීන්ගේ බඳවා ගැනීමේ සහ වේතන ගෙවීමේ පටිපාටිය,

(ආ) එවැනි ක්‍රීඩාංගණයකට සපයා ඇති පහසුකම් ප්‍රයෝජනයට ගන්නා ආකාරය,

(ඇ) එවැනි ක්‍රීඩාංගණයක පාවිච්චි කරනු ලබන උපකරණවල ඇති ආරක්ෂාකාරීත්වය පිළිබඳ ප්‍රමිතීන් සඳහා ද,

බලය තිබිය යුතුය.

## V වැනි කොටස

## පොදු විධිවිධාන

අමාත්‍යවරයාගේ විශේෂ හෝ සාමාන්‍ය විධාන.

48. (1) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් මණ්ඩලවල බලතල කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඒ සභා කමිටු සංගම් හෝ වෙනත් මණ්ඩල වෙත ලිඛිත විධාන නිකුත් කළ හැකි අතර, ඒ සභා කමිටු සංගම් හෝ වෙනත් මණ්ඩල විසින් ඒ විධානය ක්‍රියාවට නැංවිය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් මණ්ඩලවල දේපළ සහ කටයුතු සම්බන්ධයෙන් වූ වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු තමාට අවශ්‍ය විය හැකි ආකාරයෙන් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඒ සභාවලට, කමිටුවලට, සංගම්වලට හෝ වෙනත් මණ්ඩලවලට කලින් කල විධාන කළ හැකි අතර, ඒ සභා කමිටු සංගම් සහ වෙනත් මණ්ඩලවල ඒ සෑම විධානයකම අනුව ක්‍රියා කළ යුතුය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, සමිතිවල, සංගම්වල හෝ වෙනත් මණ්ඩලවල කටයුතු සියල්ලම හෝ ඉන් යම් කොටසක් තමන් විසින් නියම කරනු ලැබිය හැකි තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කර වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කළ නියම කළ හැකි අතර එසේ නියම කරනු ලැබූ කල්හි ඒ ඒ සෑම නියමයක්ම ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පහසුකම් සැලැස්වීම සහ සියලු තොරතුරු සැපයීම ඒ සභා, සමිති, සංගම් හෝ වෙනත් මණ්ඩල විසින් කළ යුතුය.

49. ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාත නියෝජනය කරමින් පැවැත්වෙන තනි තනි ක්‍රීඩකයින් හෝ ක්‍රීඩක කණ්ඩායම් ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී හෝ ක්‍රීඩාවලට සහභාගී වීම නියෝග මගින් විධිමත් කිරීම ද, පාලනය කිරීම ද, අමාත්‍යවරයා විසින් කළ හැකිය.

50. පළාත් පාලන ආයතනයක් මණ්ඩලයක් හෝ යම් ස්වාමියෙකු විසින් සැපයිය යුතු අවම ක්‍රීඩා සහ විනෝදාත්මක පහසුකම් මොනවා දැයි අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

51. (1) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහාත්, මේ ප්‍රඥප්තියේ නියම කරනු ලැබීමට නියමිත හෝ නියෝග පැදීමට නියමිත සියලු කරුණු සඳහාත්, අමාත්‍යවරයා විසින් නියෝග සම්පාදනය කළ හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි සෑම නියෝගයක් ම යෝග්‍ය ආකාරයේ දැනුම් දීමක් මගින් ප්‍රසිද්ධියට පත්කළ යුතු අතර, එසේ ප්‍රසිද්ධියට පත් කරන දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කර තිබිය හැකි පසු දිනයක දී එය ක්‍රියාත්මක විය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම යෝග්‍ය ආකාරයේ දැනුම් දීමක් මගින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබීමෙන් පසු පහසුකම් ලැබූ හැකි ඉක්මනින් පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතියේ දිනයෙහි සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු නමුදු, ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය යෝග්‍ය ආකාරයේ දැනුම් දීමක් මගින් ප්‍රසිද්ධ කළ යුතුය.

52. මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ පළාතේ ක්‍රීඩා සභාවේ සාමාජිකයන්ට, මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ ප්‍රමාණයෙන් අනුව පාරිශ්‍රමික මුදලක් ගෙවනු ලැබිය හැකිය.

53. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි – අර්ථ නිරූපණය

"අමාත්‍යවරයා" යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් ක්‍රීඩා විෂයය හෝ කාර්යය පවරන ලද අමාත්‍යවරයා අදහස් වන අතර, "අමාත්‍යාංශය" යන්න ඒ අනුව තේරුම් ගත යුතුය.

"ලේකම්" යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් සභාවේ ක්‍රීඩා විෂයය පැවරී ඇති අමාත්‍යාංශයේ ලේකම් වරයා අදහස් වේ.

"ක්‍රීඩාව" හෝ "ක්‍රීඩා" යන්නට අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා ක්‍රීඩා වශයෙන් පිළිගනු ලැබූ යම් ආකාරයක ක්‍රීඩා, විනෝද ක්‍රීඩා ශාරීරික ව්‍යායාම, සායාචිත්‍රණ ව්‍යායාම් සහ වෙනත් ව්‍යායාම් ඇතුළත් වේ.

"සංගමය" යන්නෙන් පළාත තුළ, යම් ප්‍රදේශයක් තුළ, ක්‍රීඩා සහ විනෝදාත්මක කටයුතු දියුණු කිරීම, දිරිගැන්වීම හා සංවිධානය කිරීම සඳහා ඇති කරන ලද යම් මණ්ඩලයක් අදහස් වේ.

"සමිතිය" යන්නෙන් විශේෂිත ගම්මාන ප්‍රදේශ තුළ ක්‍රීඩා දිරිමත් කිරීම, පැවී දියුණු කිරීම හා සංවිධානය කිරීම සඳහා පිහිටුවන ලද ප්‍රාථමික සංවිධානයන් අදහස් වේ.

මෙම ප්‍රඥප්තිය අර්ථනිරූපණයෙහි වියාකූල තත්වයක් ඇති වන විට සිංහල පාඨය බලපැවැත්විය යුතුය. ඉංග්‍රීසි අනුවාදයේ සංශෝධනය, අදහස හා තේරුම් පිළගනු ලැබේ.

10-335/3
F 2 - B 076235